සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை | 02 மணி |
| Diagnostic Test | 02 Hours |
| ඉතිහාසය 11 | 10ශ්‍රේණිය |
| வரலாறு 11 | தரம் 10 |
| History 11 | Grade 10 |

- **I** කොටසේ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න පහකට ද ඇතුළුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහිද, ලකුණු කර නම් කරන්න.

(i) කලා වැව, දැදුරු ඔය, ජම්බුකෝල පට්ටන, සීගිරිය, මහියංගනය, ගල්හ නදී, පොළොන්නරුව, පුත්තලම, මිනිහාගල්කන්ද, සෙංකඩගල, පාහියංගල, කෝට්ටේ.

(ලකුණු 12)

(ii) බ්‍රිතාන්‍යය, ගෝව, අරාබිය, සුමාත්‍රා, චීනය, ඉතාලිය

(ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(A) ලම්බකර්ණ පෙළපතේ ආරම්භක පාලකයා


(B) ත්‍රිපිටක ධර්මයට අටුවා රචනා කළ මහා විහාරයේ අධ්‍යයන කටයුතු කළ විදේශික භික්ෂුව

(C) පනාකඩුව තඹ සන්නසේ අනුරාධපුරය නම් කිරීමට යොදා තිබෙන නාමය

(D) සීගිරි චිත්‍ර කුමන සියවසකට අයත් ද?

(ලකුණු 04)

පහත A සහ B වලින් දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

(ii) 1) A වලින් දැක්වෙන නිර්මාණය කුමක් ද?

2) මෙය සොයාගෙන ඇත්තේ කුමන ස්ථානයෙන් ද?

3) මෙම නිර්මාණය කුමන කාලයකට අයත් සේ සැලකේ ද?

4) මින් පිළිඹිබු වන විශේෂත්වය කුමක් ද?

(ලකුණු 04)



B

(iii) 1) B වලින් දැක්වෙන්නේ පින්තූරය කුමක් ද?

2) මෙය සොයාගනු ලබන්නේ කවර ප්‍රදේශයකින් ද? 3)

3) මෙම ස්ථානය කුමක් සඳහා භාවිතා කර තිබේ ද?

4) මෙය කුමන සියවසකට අයත් ද?

(ලකුණු 04)

## II කොටස

02) (i) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර බෙදෙන ප්‍රධාන කොටස් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉතිහාසය ගොඩනගා ගැනීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වර්තමානය වන විට පුරා විද්‍යාත්මක මූලාශ්‍ර විනාශ වන අවස්ථා නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03) (i) A) ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල්ම මානවයා හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

B) ඔවුන් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූ පරිසර කලාප දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පූර්ව ඓතිහාසික යුගය පරිවර්තන යුගයක් ලෙස සැලකීමට හේතු වූ සාධක දෙකක් දක්වන්න. (ලකුණු 04)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ස්වරූපය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඓතිහාසික යුගයේ පැවති ආර්ථික රටාව තුළ කෘෂිකර්මාන්තය සංවිධානය වී තිබූ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

04) (i) රට එක්සත් කිරීමේ කාර්යයේ දී දුටුගැමුණු රජුට සහාය දුන් සෙන්පතිවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A සිට D තෙක් ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

A - මෙරට පාලනය කළ ප්‍රථම රජු

B - වසභ රජුගෙන් පසුව රජ බවට පත්වූ ඔහුගේ පුත්

C - කුඩා කළ කීර්ති නමින් හැඳින්වූ කුමරු

D - කිසිදු සතෙකු නොමැරිය යුතු බවට මුල් වරට නීතියක් පනවන ලද්දේ

(භාතිකාභය රජු, I විජයබාහු රජු, IV කාශ්‍යප, අමණ්ඩ ගාමිණී අභය රජු, පණ්ඩුකාභය, ධාතුසේන, වංකනාසිකතිස්ස, බද්ධදාස රජු) (ලකුණු 04)

(iii) පාලකයකු තම රටවැසියා වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වසභ රජතුමා මෙරට බිහිවූ ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු තුනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 06)

05) (i) ක්‍රි.ව. 11 සිට 13 දක්වා කාලය තුළ මෙරටේ ක්‍රියාත්මක වූ දකුණු ඉන්දියානු සම්භවයක් ඇති

වෙළෙඳ සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A) රාජ්‍යත්වය පිළිබඳව ඉදිරිපත්ව ඇති සංකල්ප දෙකක් දක්වන්න. (ලකුණු 02)

B) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය හිමි වූ ආකාර දෙකක් දක්වන්න. (ලකුණු 02)

(iii) අප රට පාලනය කළ බුද්ධිමත් රජවරු අසල්වැසි රටවල් සමඟ සුහදශීලී සබඳතාවකින් කටයුතු කළ ආකාරය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ සිට මෙරට තුළ වාර්ගික සහජීවනය පැවති බවට ඇති සාධක නිදසුන් තුනක් මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

06) (i) රටක පාලනය මෙහෙයවන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A සිට D තෙක් ඇති ප්‍රකාශනවලට වඩාත් ගැළපෙන පිළිතුර ලියන්න.

A - කිසියම් රටක භූමියේ නිදහස හා අඛණ්ඩතාව යන සංකල්පය හඳුන්වනු ලබන කෙටි පදය කුමක්ද?

B - වියළි කලාපයේ වැසියන් වැව් පද්ධතියක් හඳුන්වන නම කුමක්ද ?

C - දිග මැනීමට භාවිතා කරන කුඩාම ඒකකය කුමක්ද ?

D - යමක් ඉහළට විසිකළ විට පොළොවට වැටීමේ මූලධර්මය හඳුන්වන නම කුමක්ද ? (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූවකු මිය ගිය විට අනුගමනය කරන්නට ඇතැයි සැළකෙන අවමංගල්‍ය චාරිත්‍ර විධි මොනවාදැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(iv) හෙළ වාස්තු විද්‍යා ගොඩනැගිලි නිර්මාණයේ දී ඒවා පරිහරණය කරන්නන්ගේ සනීපාරක්ෂාව හා ස්වස්තථාව කෙරෙහි අවධානය යොමුකර ඇති ආකාරය සාධක තුනකින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07) (i) බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකළ පොකුණු තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A සිට D තෙක් ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - විශාල වැව් වලින් ප්‍රවේශමෙන් ජලය පිටතට ගැනීමට නිර්මාණය කර ඇති ව්‍යුහය

B - ඇළ මාර්ගවල මසුන් ඇල්ලීම වෙනුවෙන් රජය අයකළ බද්ද

C - සෙල්ලිපි වල සභාව යනුවෙන් දක්වා ඇත්තේ,

D - අකුණු වලින් ජනිත වන විද්‍යුතය හඳුන්වන්නේ,
(ව්‍යවස්ථාදායකය, බිසෝකොටුව, ස්තිරී විද්‍යුතය, විධායකය, බොජකපති, සොරෙව්ව, වජ්‍ර චුම්බට, මතරමජිබක) (ලකුණු 04)

(iii) අතීතයේ සිටම අන්තර්ජාතික වෙළඳ කටයුතුවල දී ශ්‍රී ලංකාව වැදගත් වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පරිසරයේ තිබෙන ස්වභාවික බව ආරක්ෂා කර ගැනීමට සහ කෘෂිකාර්මික කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා පාලකයින් විසින් පනවා ඇති නීති තුනක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

08) (i) A) පැරණි කාසි පිළිබඳව හදාරන විෂය හඳුන්වනු ලබන්නේ කවර නමකින් ද? (ලකුණු 01)

B) මෙරටින් හමු වී ඇති විදේශීය කාසි වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) දෙමළ ජනතාවගේ වන්දනාමානයට ලක්වන මෙරට පිහිටි පැරණි හින්දු කෝවිල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) රජරට ශිෂ්ටාචාර සමයට අයත් සිංහල භාෂාවෙන් රචිත සාහිත්‍ය කෘතීන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) මෙරට මහ වැව් තැනීමට හේතු වූ සාධක, කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(v) හෝපිටිගමුව ටැම් ලිපියේ සඳහන් වන ආකාරයට වෙළඳ පොළක පාලනය සඳහා පනවා තිබූ නීති තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

09) (i) අතීත සමාජයේ ප්‍රභුවරුන්ට පහළින් සිටි සාමාන්‍ය ජනතාව සෙල්ලිපිවල හඳුන්වා ඇති නාමය ලියන්න. (ලකුණු 01)

(ii) ඇළහැර ඇළ මගින් ජලය සැපයූ වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) පහත A, B, C, D යටතේ දක්වා ඇත්තේ ශිලා ලිපිවල සඳහන් වන වචන කිහිපයකි. ඒවායේ සරල අදහස අනුපිළිවෙළින් ලියන්න.

A - පණ්ණසාලා

B - සදිවිහරින

C - වසවසික සභය්ක

D - එක්තැන්සමිය (ලකුණු 04)

(iv) රළපනාව සහ බිසෝකොටුව යන අංග වැවකට එක් කිරීම තුළින් සපුරා ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(v) පැරණි කාලයේ ශ්‍රී ලංකාවේ කාන්තාවට හිමිව තිබූ තැන කරුණු තුනක් ඔස්සේ විමසන්න. (ලකුණු 06)